ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජනවාරි 2020

## (AA22) පිරිවැය ගිණුම්කරණය හා වාර්තාකරණය

(Cost Accounting and Reporting)

---

ප්‍රශ්න 10 ක් සහිත කොටස් 4 කින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත විය. මෙම ප්‍රශ්න පත්‍රය මගින් පිරිවැය ගිණුම්කරණයට අදාල මූලික සංකල්ප පිළිබඳ දැනුම පරීක්ෂා කර තිබේ. අයදුම්කරුවන් සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු විය. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවට අනුව ප්‍රශ්න පත්‍රයට උත්තර සැපයිය යුතුවේ. ප්‍රශ්න 10 සකසා තිබුණේ පහත සදහන් පරිදිය:

**A – කොටස -** ලකුණු 20

එකිනෙකට වෙනස් ස්වරූපයෙන් යුතු වාස්තවික පරීක්ෂණ ප්‍රශ්නවලින් මෙම කොටස සමන්විත විය. සියලුම ප්‍රශ්නවලට උත්තර ලිවිය යුතු විය.

**B – කොටස -** ලකුණු 25

එකකට ලකුණු 5 ක් බැගින් වූ අනිවාර්යය ප්‍රශ්න පහකි.

**C – කොටස -** ලකුණු 30

එකකට ලකුණු 10 බැගින් වූ අනිවාර්යය ප්‍රශ්න තුනකි.

**D – කොටස -** ලකුණු 25

එක් අනිවාර්ය ප්‍රශ්නයකි.

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)

(ලකුණු 20)

**ප්‍රශ්න අංක 01** - (ලකුණු 20)

මෙම ප්‍රශ්නයෙන් විෂයයට අදාල විවධ මාතෘකා එනම්, පිරිවැය ගිණුම්කරණයේ අරමුණු, පිරිවැය ගිණුම්කරණයේ මූලික නිර්වචන, පිරිවැය වර්ග, පොදුකාර්ය අන්තර්ග්‍රහණය, තොග මට්ටම්, සමායන ලක්ෂය වැනි දෑ පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම මැනීම සිදුවිය.

මෙම විෂයයෙහි සමස්ථ විෂය පථයම මෙම ප්‍රශ්නයෙන් ආවරණය විය.

අයදුම්කරුවන්ගේ කාර්යසාධනය සමස්ථයක් ලෙස ගත්කළ සතුටුදායක මට්ටමක පැවතුණු අතර මෙම ප්‍රශ්නය සඳහා සැළකිය යුතු අයදුම්කරුවන් පිරිසක් ලකුණු 13 කට වඩා ලබාගෙන තිබුණි..

**<u>පොදු දුර්වලතා</u>:**

1.8 ප්‍රශ්නය සඳහා අයදුම්කරුවන්ගේ කාර්යසාධනය ඉතාමත් දුර්වල මට්ටමක පවතී. දෙන ලද ප්‍රකාශනය **"සත්‍ය"** ද **"අසත්‍ය"** ද යන්න නිවැරදිව සටහන් කිරීමට අයදුම්කරුවන්ගෙන් බහුතරයකට නොහැකි විය.

(1) මෙම ප්‍රකාශය "සත්‍ය" වූවද වැඩිදෙනෙක් මෙය "අසත්‍ය" යැයි දක්වා තිබුණි. අයවැය පිළිබඳ අයදුම්කරුවන්ගේ අල්ප දැනුම මෙයින් ගම්‍ය වේ.

(2) මෙම ප්‍රකාශය "අසත්‍ය" වුවද බහුතරයක් මෙය "සත්‍ය" යැයි දක්වා තිබුණි. පෙරසැරි ගිණුම්කරනය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම වැඩිදියුණු විය යුතුය.

(3) මෙය "සත්‍ය" වූවද බහුතරයක් "අසත්‍ය" ලෙස දක්වා තිබුණි. මෙයට හේතුව පොදුකාර්ය සම්බන්ධයෙන් වු අල්ප දැනුම වේ.

(4) මෙය "සත්‍ය" වුවද බහුතරයක්, අඛණ්ඩ මෙහෙයුම් පිරිවැයකරණය පිළිබඳව ඇති දුර්වල දැනුම හේතුවෙන් මෙය "අසත්‍ය" ලෙස දක්වා තිබුණි.

මෙම විෂයයෙහි සියලුම කාරණා එනම්, න්‍යායාත්මක සංකල්ප හා ඒවායේ භාවිතයන්ද ඇතුළුව, සියලුම දේවල් හොඳින් අධ්‍යනය කර තිබීම අයදුම්කරුවන්ගෙන් අපේක්ෂා කෙරේ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

## B කොටස

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)

(මුළු ලකුණු 25)

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය මගින් ප්‍රථම-ලැබීම්-ප්‍රථම නිකුතු ක්‍රමය යටතේ (FIFO) ගබඩා ලෙජරය පිළියෙල කිරීම අවශ්‍ය විය.

කෙසේ නමුත් පහත දුවර්වලතා ද හඳුනාගන්නා ලදී:

- තොග ලෙජරය පිළියෙළ කිරීමේදී නිවැරදි ආකෘතිය භාවිතා කර නොතිබුණි. සමහර අයදුම්කරුවන් භාණ්ඩ ලැබීම් සහ නිකුත් කිරීම් සටහන් කිරීමට T ගිණුම් පිළියෙල කර තිබුණි.
- සෑම ගනුදෙනුවකටම පසු ශේෂය ගණනය කළ යුතු වීම තොග ලෙජරයේ අවශ්‍යතාවයක් වුවද, එය සිදුකර නොතිබීම.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

### ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය මගින් කැලි අනුපාත ක්‍රමය යටතේ සේවකයන්ගේ ඉපැයීම් ගණනය කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂාකර තිබුණි.

මෙයින් අපේක්ෂා කරන ලද්දේ සාමාන්‍ය ගෙවීම් ගණනය කර අපේක්ෂිත නිමැවුමට වඩා වැඩියෙන් නිපදවා ඇති ඒකක ගණන සොයා ප්‍රසාද ඉපැයීම් ගණනය කිරීම වේ.

කෙසේ නමුත් පහත දුවර්වලතා ද හඳුනාගන්නා ලදී:

- බහුතරයක් අයදුම්කරුවන්ට නිමැවුම් ඒකක ගණන වන 1,120 රු.15/- න් ගුණකර, **B ශ්‍රමිකයාගේ** සාමාන්‍ය ගෙවීම ගණනය කිරීමට නොහැකි විය. ඒ වෙනුවට, **A ශ්‍රමිකයාගේ** නිමැවුම වන ඒකක 960 න් එය ගුණකර තිබුණි.
- තවත් සමහර අයදුම්කරුවන්, සේවකයන් විසින් අපේක්ෂිත නිමැවුමට වඩා නිපදවා ඇති විට ඔවුන්ගේ මුළු ඉපයීම නිවැරදිව ගණනය කිරීමට අපොහොසත් විය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 04

මෙම ප්‍රශ්නය මගින් අයදුම්කරුවන් විසින් අමුද්‍රව්‍ය තොග පාලන ගිණුම සහ නොනිමි වැඩ පාලන ගිණුම යන ගිණුම් දෙක පිළියෙල කිරීම අවශ්‍ය විය.

කෙසේ නමුත් පහත දුර්වලතා ද හඳුනාගන්නා ලදී:

- මෙම ගිණුම් දෙකට සටහන් කළ යුතු අයිතම පටලවාගෙන තිබීම.
- අදාල පිරිවැය ලෙජර ගිණුම් හි එක් එක් අයිතමය ඇතුළත් කරන්නේ ඇයිද යන්නට හේතු අයදුම්කරුවන් විසින් තේරුම්ගත යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 05

කාර්ය පිරිවැයකරණය නිවැරදිව භාවිතා කරන ආකාරය පිළිබඳවත් කිසියම් කාර්යක් සඳහා අයකළ යුතු මිල තීරණය කිරීම පිළිබඳවත් අයදුම්කරුවන්ගේ දැනුම මැනීම මෙහි අපේක්ෂාව විය.

දෙන ලද දෙපාර්තමේන්තු දෙක සඳහා සෘජු ශ්‍රමය සහ පොදුකාර්යය ගණනය කර ලාභ ආන්තිකය භාවිත කර අදාල කාර්යයේ විකුණුම් මිල ගණනය කිරීම මෙම ප්‍රශ්නයේ අවශ්‍යතාවය විය.

කෙසේ නමුත් පහත දුර්වලතා ද හඳුනාගන්නා ලදී:

- "ලාභ ආන්තිකය" සහ "මිල අධිකය" පිළිබඳ අල්ප දැනුම පිළිතුරුවලින් ගම්‍ය වේ. සමහරක් අයදුම්කරුවන් ඉතා පහසුවෙන් මුල් පිරිවැයට 20% ක් එකතුකර විකුණුම් මිල ගණනය කර තිබුණි.
- සමහරක් අයදුම්කරුවන් දෙපාර්තමේන්තු දෙක නිෂ්පාදිත දෙකක් ලෙස සළකා ගණනය කිරීම් සිදුකර තිබුණි.
- අයදුම්කරුවන් විසින් ලාභය පිරිවැය මත, එනම් (ආන්තිකය) ලෙසද, විකුණුම් මත එනම් අධිකය ලෙසද ප්‍රකාශ කළ හැකි බව වටහා ගත යුතු අතර එම සංකල්ප අතර වෙනස හොඳින් තේරුම් ගත යුතුය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක විය.**

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නයෙන් පිරිවැය ගිණුම්කරණය සහ මූල්‍ය ගිණුම්කරණය අතර ලාභ සැසඳීමේ ප්‍රකාශයක් පිළියෙල කිරීම අවශ්‍ය විය.

කෙසේ නමුත් පහත දුර්වලතා ද හඳුනාගන්නා ලදී:

- ලාභ සැසඳීම යන සංකල්පය අයදුම්කරුවන්ගෙන් වැඩි දෙනෙක් නිවැරදිව තේරුම්ගෙන නොතිබුණි. තව දුරටත් ඔවුන් විසින් මූල්‍ය ගිණුම්කරණ ලාභය ගෙන පිරිවැය ගිණුම්කරණය අනුව අගයන් එයට එකතුකර දක්වා තිබුණි. මෙහිදී එම ගිණුම් දෙවර්ගය අතර අගයන් හි වෙනස සැලකිල්ලට නොගෙන සමහරක් අයදුම්කරුවන් අවසාන අගයන් සැලකිල්ලට ගෙන තිබුණි.
- සැසඳුම් ප්‍රකාශය නිවැරදිව පිළියෙල කළ අයදුම්කරුවන් පවා අවසාන තොගය සහ ආරම්භක තොගය ගැලපීමේදී වරදවාගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

# <u>C කොටස</u>

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)

(මුළු ලකුණු 30)

## ප්‍රශ්න අංක 07

පෙරසැරි පිරිවැයකරණය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම මෙහි අරමුණ විය. මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් ඉතා හොඳින් පිළිතුරු ලියා තිබුණි.

<u>කෙසේ නමුත් පහත දුවර්වලතා ද හඳුනාගන්නා ලදී:</u>

- සාමාන්‍ය අපතය සහ අසාමාන්‍ය අපතය යන පෙරසැරි පිරිවැයකරණයට අදාල සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධය නොතිබුණි.
- පෙරසැරි ගිණුමේ පැති දෙක මාරු කරගත් අවස්ථාද දක්නට ලැබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතාමත් සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 08

මෙම ප්‍රශ්නයේ අවශ්‍යතාවය වුයේ, පොදුකාර්ය බෙදා වෙන්කිරීමේ ප්‍රකාශයක් පිළියෙල කිරීමත්, එක් එක් දෙපාර්තමේන්තුව සඳහා පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාතය ගණනය කිරීමත්ය.

කාර්යසාධනය තරමක් දුරට හොඳය. අයදුම්කරුවන්ගෙන් සැළකිය යුතු පිරිසක් මෙම ප්‍රශ්නයට සතුටුදායක ලෙස ලකුණු ලබාගෙන තිබුණි.

<u>කෙසේ නමුත් පහත දුවර්වලතා ද හඳුනාගන්නා ලදී:</u>

- පොදුකාර්ය නිෂ්පාදන සහ සේවා දෙපාතමේන්තු අතර බෙදා හැරීමේදී බහුතරයක් අයදුම්කරුවන් ගණිතමය දෝෂ (එකතු කිරීමේ දෝෂ) සිදුකර තිබුණි.
- පොදුකාර්ය මූලික වෙන්කිරීම, බොහෝ අයදුම්කරුවන් විසින් නිවැරදිව සිදුකළද සේවා දෙපාර්තමේන්තුවල පොදුකාර්ය නිෂ්පාදන දෙපාර්තමේන්තුවලට විභජනය කිරීම නිවැරදිව සිදුකර නොතිබුණි.
- සමහරක් අයදුම්කරුවන් සේවා දෙපාර්තමේන්තුවල පොදුකාර්ය අන්තර්ග්‍රහණ අනුපාත මාරු කරගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 09

විකුණුම් අයවැය, නිෂ්පාදන අයවැය සහ සෘජු ද්‍රව්‍ය භාවිත අයවැය පිළියෙල කිරීම මෙම ප්‍රශ්නයෙන් අවශ්‍ය විය.

<u>කෙසේ නමුත් පහත දුවර්වලතා ද හඳුනාගන්නා ලදී:</u>

- විකුණුම්, අවසාන තොග සහ ආරම්භක තොග අගයන් (ඒකක ගණනින්) ප්‍රශ්නයේ නිවැරදිව දී තිබුණද අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු පිරිසක් නිෂ්පාදන අයවැය නිවැරදිව පිළියෙල කර නොතිබුණි.
- සමහරක් අයදුම්කරුවන් අයවැය තීරණය කිරීමේ මූලික මූලධර්ම පවා නොදැන සිටියහ. විශේෂයෙන් කොතනින් ආරම්භකළ යුතු ද යන්න පිළිබඳව ඔවුන්ට අදහසක් නොවීය.
- පසුගිය විභාග ප්‍රශ්න පුහුණුවීම නිර්දේශ කෙරේ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

**ප්‍රශ්න අංක 10**

මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් යුක්ත විය. **(A) කොටස** මඟින් දෙන ලද විචලතාවන් ගණනය කිරීම අවශ්‍ය වූ අතර **(B) කොටස** මඟින් ආන්තික පිරිවැයකරණය අනුව ආදායම් ප්‍රකාශය පිළියෙල කිරීමත් ආන්තික පිරිවැයකරණ ක්‍රමයේ වාසි දෙකක් සඳහන් කිරීමත් අවශ්‍ය විය.

**(A) කොටසේ** කාර්යසාධනය සතුටුදායක වූ අතර **(B) කොටසේ** කාර්යසාධනය දුර්වල මට්ටමක පැවතිණි.

<u>කෙසේ නමුත් පහත දුවර්වලතා ද හඳුනාගන්නා ලදී:</u>

- විචලතාවයන් ගණනය කීරීමේදී බහුතරයක් අයදුම්කරුවන් අදාල සූත්‍ර දක්වා නොතිබුණි.
- අයදුම්කරුවන්ගෙන් බහුතරයක් අදාල විචලතාවය වාසිදායකද අවාසිදායකද යන්න දක්වා නොතිබුණි.
- **(B) කොටසට** පිළිතුරු සැපයීමට බහුතරයක් ඉදිරිපත් වී නොසිටියහ.
- ප්‍රශ්නයෙන් අවශ්‍ය නොවුවද සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් අන්තර්ග්‍රහණ පිරිවැයකරණ ක්‍රමය යටතේ ආදායම් ප්‍රකාශය පිළියෙල කර තිබුණි.
- දෙන ලද ප්‍රශ්නයේ සත්‍ය සහ අයවැයගත අගයන් සසඳමින් අයදුම්කරුවන් විසින් වාසි දක්වා තිබුණි. මෙයින් හැඟෙන්නේ මේ සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම ඉතාමත් දුර්වල බවය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

(1) නව විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිප වතාවක් මනා අවධානයකින් කියවිය යුතු අතර, අවශ්‍ය තැන්වලදී පෙරවැඩ පැහැදිලිව පෙන්විය යුතුය.

(3) ප්‍රශ්න වලට උත්තර සැපයීමේදී උපකල්පනයන් කර ඇත්නම් ඒවා පැහැදිලිව පෙන්විය යුතුය.

(4) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය. උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරික්ෂා කර බැලීම.

(5) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(6) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා යෝජිත උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය. සමාන රටාවන්ගෙන් හා ව්‍යුහයන්ගෙන් යුත් ප්‍රශ්න නැවත නැවත විභාගයන්හිදී පරික්ෂා කළ හැකි බැවින් මෙම ක්‍රමය අනුගමනය කිරීම වාසිදායකය.

(7) ස්ව-අධ්‍යයන පාඩම්මාලා අධ්‍යයනය කිරීම හා එහි ඇති උත්තර පරිශීලනය කිරීම ඉතා වැදගත්ය.

(8) මෙම විෂය සම්බන්ධව ඇති පොත්පත්, සඟරා හා ලිපි ආදිය පරිශීලනය කළ යුතුය.

(9) විභාගයේදී කාලය මනාව කළමනාකරණය කර ගැනීම. එක් එක් ප්‍රශ්නයට වෙන්කර ඇති ලකුණු මඟින් ඒ සඳහා වෙන්කළ යුතු කාලය පිළිබඳ අවබෝධයක් ලබා ගත හැකිය.

(10) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -